ඇමුණුම "ආ"
2019.07 ..... දිනැති
අංක MOD/FD/DG(A&F)/AQ/19 දරණ ලිපිය

පාර්ලිමේන්තු අනු අංකය - 76

ආයතනයේ නම - ශ්‍රී ලංකා ගුවන් හමුදාව

කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා/කමිටුව විසින් ලබා දුන් නියෝග	දුර්වලතා නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග / නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්වය
දුර්වලතාවය 1. 2016 වර්ෂයේ මූලධන ඇස්තමේන්තු යටතේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් 77.6% ක ඉතිරිවීමක් පෙන්නුම් කර තිබීම. **කමිටු නියෝගය** ප්‍රතිපාදන ඉතිරි වීමට හේතුව සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් කාරක සභාව වෙත හා විගණකාධිපතිවරයා වෙත 2018/07/05 දිනට පෙර යොමු කරන ලෙස කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය.	මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කිරීම සඳහා ශ්‍රීලංගුහ/2016/5/විගණන/අවිඅ යොමු දරණ 2019 පෙබරවාරි 21 දිනැති ලිපිය මගින් ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කර ඇත.
දුර්වලතාවය 2. සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ ශ්‍රී ලංකා හෙලිටුවර්ස් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් ලෙස රජයේ නිළධාරීන් කටයුතු කිරීම සම්බන්ධව පවතින නීතිමය තත්වය. **කමිටු නියෝගය** ආයතනය සුභසිද්ධිය ද සැලසෙන පරිදි එම අරමුදල් පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හා ත්‍රිවිධ හමුදාපතිවරුන් ද කැඳවා විධිමත් වැඩපිළිවෙලක් සකසන මෙන් කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය.	(1) ගුවන්හමුදාධිපති විසින්, ශ්‍රීලංගුහ/සී.99/6/3/ගුමෙඅ දරණ 2018 ජනවාරි 24 දිනැති ලිපිය මගින් හෙලිටුවර්ස් පුද්ගලික සමාගමෙහි කොටස් විධිමත් කිරීම සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇත. (එම ලිපියේ පිටපතක් පරිශිෂ්ඨ "1" ලෙස මෙයට යා කර ඇත). (2) ඉහත ඉල්ලීම් ලිපියට පිළිතුරු ලෙස, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2018 ජුලි මස 25 වන දිනැති ලිපිය මගින් අදාළ සමාගම් කොටස් භාණ්ඩාගාරයේ ලේකම් වෙත පවරන මෙන් උපදෙස් ලබා දී ඇත.(එම ලිපියේ පිටපතක් පරිශිෂ්ඨ "2" ලෙස මෙයට යා කර ඇත). (3) තවද, හෙලිටුවර්ස් පුද්ගලික සමාගම විසින් භාණ්ඩාගාරය වෙත පැවරිය යුතු කොටස් ප්‍රතිශතයට අදාළව උපදෙස් ලැබී නොතිබූ බැවින් ඊට අදාළ උපදෙස් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීම සඳහා අංක ශ්‍රීලංගුහ/සී.99/6/3/ගුමෙඅ දරණ 2018 සැප්තැම්බර් දිනැති ලිපිය මගින් ඉල්ලීම් කර ඇත. (ලිපියෙහි පිටපතක් පරිශිෂ්ඨ "3" ලෙස මෙයට අමුණා ඇත).

කමිටුව විසින් හදුනාගත් දුර්වලතා/කමිටුව විසින් ලබා දුන් නියෝග	දුර්වලතා නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග / නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්වය
	(4) පසුව, හෙලිටුවර්ස් පුද්ගලික සමාගමෙහි කොටස් භාණ්ඩාගාරය වෙත පැවරීම හා එහි ශක්‍යතාවය සම්බන්ධයෙන් මූලික රැස්වීමක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා හෙලිටුවර්ස් පුද්ගලික සමාගමෙහි නිළධාරීන් අතර 2019 ජනවාරි 24 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේදී පවත්වන ලදී. එම රැස්වීමෙහි ප්‍රථිඵලයක් ලෙස, හෙලිටුවර්ස් පුද්ගලික සමාගමට සුදුසු ව්‍යාපාර ආකෘතියක් හදුනා ගැනීම සඳහා සමාගමෙහි මූල්‍ය තත්වය සමාලෝචනය කිරීමට තීරණය විය. ඒ අනුව, 2019 මාර්තු මස 19 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දෙදෙනෙකු හෙලිටුවර්ස් පුද්ගලික සමාගම වෙත පැමිණ ඊට අදාළ විමර්ෂණය සිදු කර ඇත. (5) එහිදී, හෙලිටුවර්ස් පුද්ගලික සමාගමෙහි අධ්‍යක්ෂවරුන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් අතර රැස්වීමක් සුදානම් කිරීමට තීරණය විය. ඒ අනුව අංක ශ්‍රීලංගුභ/සී.99/6/3/ගුමෙඅ දරන 2019 මාර්තු මස 27 දිනැති යොමුගත ලිපිය මගින්, 2019 අප්‍රේල් මස 10 වන දින රැස්වීමක් පැවැත්වීමට යෝජනා විය.(ලිපියෙහි පිටපතක් පරිශිෂ්ඨ "4" ලෙස මෙයට අමුණා ඇත). නමුත් 2019 අප්‍රේල් මස 09 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සේවා අවශ්‍යතාවයක් හේතුවෙන් රැස්වීමට සහභාගී විය නොහැකි බව දැන්වීය.(ලිපියෙහි පිටපතක් පරිශිෂ්ඨ "5" ලෙස මෙයට අමුණා ඇත). (6) 2019 මැයි මස 10 වන දින හෙලිටුවර්ස් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල සමාජිකයින් දෙදෙනෙකු සහ අනෙකුත් නිළධාරීන්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ අදාළ නිළධාරීන් අතර සාකච්ඡාවක් පැවැත්විණ. එහිදි පහත තීරණ ගන්නා ලදි. අ. සමාගමේ සම්පූර්ණ කොටස් අයිතිය භාණ්ඩාගාර ලේකම් වෙත පැවරීම. ආ. හෙලිටුවර්ස් සමාගමේ මෙහෙයුම් කටයුතු සහ කළමණාකරණය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත රඳවා තබා ගැනීම. ඇ. මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් සමාගම් අධ්‍යක්ෂවරයෙක් ලෙස හෙලිටුවර්ස් සමාගමට පත් කිරීම. ඈ. ගුවන්යානා කුලී පදනම මත ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ හෙලිටුවර්ස් සමාගම අතර ගිවිසුමක් ඇති කර ගැනීම. ඉ. හෙලිටුවර්ස් සමාගමේ සියළුම නඩත්තු වියදම් සහ හෙලිටුවර්ස් සමාගම විසින් භාවිතා කරනු ලබන සියළුම නිශ්චල සහ චංචල දේපළ (මානව සම්පත් ද ඇතුළුව) ගණනය කර, හෙලිටුවර්ස් සමාගමේ ආදායම් ප්‍රතිශතයක් ලෙස රජයේ ගිණුමට සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සුභ සාධන කටයුතු සඳහා වෙන් කිරීම.

කමිටුව විසින් හඳුනාගත් දුර්වලතා/කමිටුව විසින් ලබා දුන් නියෝග	දුර්වලතා නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග / නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්වය
දුර්වලතාවය **3.** ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් සපයන ලද ගුවන් ගමන් වෙනුවෙන් **2017.12.31** දිනට අයවිය යුතුව ඇති රු.මි **13.47** ක හිඟ මුදල අයකර ගැනීමේ ප්‍රගතිය. **කමිටු නියෝගය** අදාළ අමාත්‍යාංශවල ලේකම්වරු කැඳවා එම මුදල සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර කාරක සභාව වෙත වාර්තා කරන මෙන් කාරක සභාව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නියෝග කළේය.	ගුවන් ගමන් වෙනුවෙන් **2017.12.31** දිනට අයවිය යුතුව ඇති රු.මි **13.47** ක හිඟ මුදල අයකර ගැනීමේ ප්‍රගතිය පරිශිෂ්ඨ "**6**" ලෙස දක්වා ඇත.
දුර්වලතාවය **4. 2009** වර්ෂයේදී පෞද්ගලික සමාගම් දෙකකින් ලබා ගත් රු. **19,691,000** ක් වටිනා වසර **15**ක වගකීමකට යටත්ව මිලදී ගත් සූර්‍යබල වීථි පහන් **187**කින් **148** ක් හා බැටරි **33**ක් **2015** වසර වනවිට ක්‍රියා විරහිත වී තිබීම නිසා සිදු වූ රු. මිලියන **16** ක අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. **කමිටු නියෝගය** තාක්ෂණික ස්වරූපයේ මිලදී ගැනීමකදී සැපයුම්කරු තෝරා ගන්නා විට ආයතනයේ පැවැත්ම සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගත යුතු බවද, ඒ සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතු බවද විගණකාධිපතිවරයා අවධාරණය කළේය.	**(1)** වර්ෂ **2009** දී ගුවන් හමුදාවට මිලදීගත් සූර්‍ය බල විදී පහන් සහ උපාංග අක්‍රියවීම අදාල භාණ්ඩ සඳහා වන වගකීම් කාලය තුල සිදු වීම හේතුවෙන් ගුවන් හමුදාව විසින් අදාල භාණ්ඩ වල අලාභය වගකීම් සහතිකය මගින් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේදී අදාල භාණ්ඩය මිලදී ගත් ආයතන ඒ වන විට වසා දමා ඇති බව අනාවරණය වී ඇත. ඒ අනුව අදාල අලාභය අයකර ගැනීම සඳහා ගත යුතු සියලුම පියවරයන් ගුවන් හමුදාව විසින් ගෙන ඇති අතර ඒ සියලුම ප්‍රයත්නයන් අසාර්ථක වීම හේතුවෙන් එම අලාභය සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කරන ලදී. එහි නිර්දේශ ගුවන් හමුදාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාල සමාගම් වලට එරෙහිව නීති මගින් කටයුතු කර අලාභය අයකර ගැනීමට නිර්දේශ කර ඇත. තවද ඉදිරියේදී මෙවැනි අලාභයන් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර මේ වන විට ගුවන් හමුදාව විසින් ගෙන ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමු. **(2)** ඒ අනුව, අදාළ වගකිව යුතු ආයතනවලට අයත් මව් ආයතන වන ඇක්සස් සෝලා පුද්. සමාගම සහ එන්වයර්න් එනර්ජි ලංකා පුද්. සමාගම වෙත එන්තරවාසි යොමු කිරීමට අවශ්‍ය සියලුම තොරතුරු ගුවන් හමුදා නීති අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නීතිපති දේපාර්තමේන්තුව වෙත **2018** ජුලි මස **5** වන දින ඉදිරිපත් කර ඇත.

කමිටුව විසින් හදුනාගත් දුර්වලතා/කමිටුව විසින් ලබා දුන් නියෝග	දුර්වලතා නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග / නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්වය
<u>**දුර්වලතාවය**</u> **5. ගිනි නිවීමේ ඒකකයේ අහස් ඉනිමං ස්ථානගත කිරීම සඳහා කොළඹ ආසන්නයේ සුදුසු ස්ථානයක් නොමැති වීම.** <u>**කමිටු නියෝගය**</u> දිනෙන් දින කොළඹ නගරය තුල ඉදි වෙමින් පවතින මහල් ගොඩනැගිලි ගින්නෙන් ආරක්ෂා කර ගැනීම සඳහා ගිනි නිවීමේ ඒකකයට අවශ්‍ය සම්පත් ලබා දීම අතිශයින් වැදගත් කරුණක් බව අවධාරණය කළ කාරක සභාව, ඒ සඳහා මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයටද විශාල වගකීමක් පැවරෙන බැවින් ගිනි නිවීමේ ඒකකයට අවශ්‍ය ඉඩමක් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත නියෝග කල කාරක සභාව, කාරක සභාවේ එම නියෝගය මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා යවන මෙන්ද, ඉදි කිරීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා වු යෝජනාව 2019 වසරේ අයවැය යෝජනා වලට ඇතුලත් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සමග මුදල් අමාත්‍යාංශයේ ලේකම් වරයා වෙත යොමු කරන මෙන්ම කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කළේය.	 (1) නාරාහේන්පිට පිහිටි බේකරියවත්ත නැමති රජයට අයත් ඉඩම අත්පත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.මි 192 සඳහා 2019 වර්ෂයේ වාර්ෂික අයවැයෙන් වෙන් කිරීම සඳහා 2018 සැප්තැම්බර් මස 12 වන දින ශ්‍රීලංගුහ/15/1/ගුවන් දරණ යොමුව මගින් මහා භාණ්ඩාගාරය වෙත දැනුවත් කළ අතර ඒ සඳහා 2019 වර්ෂයේදී රු. මිලියන 50 ලබා දී ඇති අතර ඉතිරිය 2020 වර්ෂයේදී ලබා දීමට 2019 මාර්තු මස 21 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී මහා භාණ්ඩාගාර නියෝජිතයින් විසින් පොරොන්දු විය. (2) තවද, ශ්‍රී ලංකා ගුවන් හමුදා ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීමට නාරාහේන්පිට මංසංධියෙහි පිහිටි බේකරියවත්ත ලෙස හඳුන්වන ඉඩම අත්පත් කර ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත පිටපතක් සහිතව අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය වෙත අංක ශ්‍රීලංගුහ/477/2/සංවිධාන දරණ 2019 මාර්තු මස 29 දාතමින් යුක්ත ලිපියක් යොමු කර ඇත (ලිපියෙහි පිටපතක් පරිශිෂ්ඨ "7" ලෙස දක්වා ඇත).

කම්ටුව විසින් හදුනාගත් දුර්වලතා/කම්ටුව විසින් ලබා දුන් නියෝග	දුර්වලතා නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග / නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්වය
දුර්වලතාවය 6. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් රේඩාර් රිසිවරයක් සහ ඇන්ටනා ස්කෑනරයක් 2014 අප්‍රේල් 04 දින වන විට අලුත්වැඩියා කටයුතු සඳහා චීනයට යවා තිබුණ නමුත් ඉහත භාණ්ඩ අස්ථාන ගත වීම හේතුවෙන් ගුවන් හමුදාවට රු. 74,457,100 ක අලාභයක් සිදුවී තිබුණු අතර එම අලාභයට වගකිව යුතු පාර්ශවයන් හදුනා ගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම මෙන්ම මෙම උපකරණය සඳහා රක්ෂණාවරණයක් ලබා ගෙන නොතිබීම. **කම්ටු නියෝගය** රක්ෂණාවරණය ලබා ගැනීමට ක්‍රියා නොකල නිළධාරින්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රියා කරන ලෙසද, අදාළ උපකරණ අස්ථාන ගත වීම හේතුවෙන් සිදු වු අලාභය අයකර ගැනීමට ක්‍රියා කරන මෙන්ද, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මේ සම්බන්ධයෙන් නිතීපති උපදෙස් ඉල්ලා යැවු ලිපිය හා ඒ සඳහා නිතිපති වරයා විසින් ලබා දුන් පිළිතුරද, එම කරුණ හා කාරක සභාවේදී විමර්ෂණයට භාජනය කරන ලද සියළු කරුණු සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් වාර්තාවක් සති දෙකක් ඇතුලත කාරක සභාව වෙත යොමු කරන මෙන්ද කාරක සභාව ප්‍ර.ග.නි/ග.නි වෙත නියෝග කරන ලදී.	(1) මෙයට සවිස්තරාත්මක වාර්තාවක් ශ්‍රීලංගුහ/සී.438/23/නීති දරණ යොමුව මගින් 2018 ජුනි මස 22 වන දින රජයේ ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත. (ලිපියෙහි පිටපතක් පරිශිෂ්ඨ "8" ලෙස දක්වා ඇත). (2) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් රේඩාර් රිසිවරයක් සහ ඇන්ටනා ස්කෑනරයක් අලුත්වැඩියාව සඳහා චීනයට ගුවන් මගින් යැවීමේදී අස්ථානගත වීම පිළිබඳව සිදුකළ පරීක්ෂණ අධිකරණයේ නිර්දේශ ගුවන් හමුදාධිපති තුමා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාළ උපකරණ චීනයට යැවීමේ දී රක්ෂණාවරණයක් ලබා නොගැනීම සඳහා වගකිව යුතු ස්කොඩ්‍රන් ලීඩර් එච්එස්පීකේ ප්‍රනාන්දු යන නිළධාරියාගෙන් අදාළ උපකරණ වල වටිනාකමින් 0.5% වන රු. 493,438.38 ක මුදලක් අයකර ගැනීමටත් ඔහුට අවවාදාත්මක ලිපියක් ලබාදීමටත්, උපකරණ අස්ථානගත වීමෙන් සිදුවූ ඉතිරි අලාභය වන රු. 98,194,092.87 ක මුදල අදාල උපකරණය චීනයට යැවීම සඳහා භාරගත් M/s Care Logistics (Pvt) Ltd ආයතනයට විරුද්ධව නීතිමය පියවර ගැනීමටත් ගුවන් හමුදාධිපති තුමා විසින් නිර්දේශ කර ඇත. (3) තවද, රජයේ ගිණුම් කාරක සභා නියෝග වලට අනුව මෙම සැපයුම් සේවා සැපයු ආයතනය වන M/s Care Logistics (Pvt) Ltd ආයතනය වෙනත් රාජ්‍ය ආයතනයක් සමග ගණුදෙනු කිරීමට නොහැකි වන සේ අසාදු ලේඛනගත කිරීමට අවශ්‍ය කටයුතු කටයුතු කරන මෙන් ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කර ඇත. (4) වර්තමානය වන විට මෙම ආයතනය සම්බන්ධයෙන් වන අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් සිදුකරන ලද පරීක්ෂණ වාර්තාව ලැබී ඇති අතර එය ඉදිරි කටයුතු සඳහා රජයේ නීතිපති වෙත ඉදිරිපත් කර ඇත.

පරිශිෂ්ඨ "1"
2019.07 ..... දිනැති
අංක MOD/FD/DG(A&F)/AQ/19 දරණ ලිපිය

මගේ අංකය ශ්‍රීලංගුහ:/සී.99/6/3/ ගුමෙඅ   දින 24 ජනවාරි මස 2018

අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුව,
භාණ්ඩාගාර දෙපාතර්මේන්තුව,
ලෝටස් පාර,
කොළඹ .01

සීමාසහිත හෙලිටුවසර් සමාගමෙහි (පුද්ගලික)කොටස් වල හිමිකාරිත්වයේ සංයුතිය (PV 72768)

යොමු:
අ. දිනැති රාජ්‍ය ගිණුම් පිලිබඳ කාරක සභා වාතර්ාව 24 ජුනි 2016
ආ. අංක S17/REP/2016 හා දිනැති ලිපිය 31 ඔක්තෝම්බර් 2016
ඇ. අංක S17/01/Com/Aud/2016-11/16 හා දිනැති ලිපිය 06 ජනවාරි 2017
ඈ. වන 29 නොවැම්බර් 2017දින නියෝජ්‍ය විගණකාධිපති සමඟ ශ්‍රී ලංකා ගුවන් හමුදා මුලස්ථානයේදී පැවති රැස්වීම
ඉ. අංක ශ්‍රීලංගුහ /165/5/ගුමෙඅ හා දිනැති ලිපිය 08 දෙසැම්බර් 2017
ඊ. අංක ශ්‍රීලංගුහ/165/5/ගුමෙඅ හා දිනැති ලිපිය 20 දෙසැම්බර් 2017
උ. දින පැවති විගණන හා කළමනා 27 දෙසැම්බර් 2017කරණ කමිටු රැස්වීම

1. ‘‘හෙලිටුවසර් ගුවන් මෙහෙයුම්’’ යනු ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි වාණිජ ශාඛාවක් වන අතර එය 1973 අප්‍රේල් මස 27 දින නිකුත් කරන ලද ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක: D.282/TRG හි විධිවිධාන යටතේ විසින් පිහිටුවන ලදී. පසුව ‘‘සීමාසහිත හෙලිටුවසර් (පුද්ගලික) සමාගම’’, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1994 ජුලි 21 වන දින සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි කරන ලදී. ඉන් පසුව 2007 අංක 07 දරන නව සමාගම් පනතෙහි විධිවිධාන යටතේ 2010 ජුලි මස 17 වන දින සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස නැවත ලියාපදිංචි කරන ලදී (ලියාපදිංචි සහතිකයෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත).

2. සමාගමෙහි වතර්මාන අධ්‍යක්ෂ මණ්ඩලය, පහත සඳහන් ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන්ගෙන් සමන්විතය.

දාම්බුරේ ලියනගේ සුමංගල ඩයස්
සුදශර්න කරාගොඩ පතිරණ
ඇලෙස්ටර් මොහාන් ද සොයිසා
කුරුකුලසූරිය ෆ්‍රැන්සිස් මරාහින්ත ප්‍රනාන්දු
ඇන්ඩෘ වෙයින් එදිරිවීර විජේසූරිය
මහිලාල් දුෂ්‍යන්ත රත්නායක

3. ඉහත සඳහන් අයවලුන්ගෙන්, පහත නිලධාරීන් තම පෞද්ගලික නම් වලින් සමාගමෙ කොටස්කරුවන් වන අතර ඔවුන්ට හිමි කොටස් ප්‍රමාණයන් එක් එක් නමට ඉදිරියෙන් දක්වා ඇත.

කොටස්කරු	**කොටස් ප්‍රමාණය**
ඩී එල් එස් ඩයස්	50,001
එස් කේ පතිරණ	01
කේ එෆ් ආර් ප්‍රනාන්දු	01
එම් ඩී රත්නායක	01

4. රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා වාතර්‍ාවට අනුව (යොමුව අ) රාජ්‍ය නිලධාරීන් විසින් සීමාසහිත හෙලිටුවසර් (පුද්) සමාගමෙහි නිලතල දැරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වී ඇත.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයේ විධිවිධාන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) අ වගන්තිය ප්‍රකාරව සියලු රජය සතු සමාගම් විගණනය කිරීම විගණකාධිපති මත පැවරෙන අතර ඒ බව යොමුව “ආ” හා “ඇ” මඟින් දන්වා ඇත.

6. 2017 නොවැම්බර් මස 29 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේදී නියෝජ්‍ය විගණකාධිපති සමඟ පැවති රැස්වීමේදී සීමාසහිත හෙලිටුවසර් (පුද්) සමාගම එහි මූල්‍ය අවශ්‍යතාවන් භාණ්ඩාගාරයෙන් වෙන් කරන රජයේ අරමුදල් මඟින් සපුරා ගැනීමත් සමාගමේ සියලු ආදායම් භාණ්ඩාගාරයට බැර කිරීමත් නිසා එය රජය සතු සමාගමක් බවට තහවුරු කර ලිඛිත ලියවිල්ලක් ලබා දීමට අවශ්‍ය විය. ඒ අනුව අප මූලස්ථානය මේ කරුණ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ඔබ දෙපාතර්මේන්තුව සමඟ හමුවක් පැවැත්වීමට යොමුව “ඉ” මඟින් දැනටමත් ඉල්ලීමක් කර ඇත.

7. අනතුරුව , රජය සතු සමාගමක් ලෙස සීමාසහිත හෙලිටුවසර් (පුද්) සමාගමෙහි තත්වය සනාථ කිරීම සඳහා වන සුදුසුම ක්‍රියාමාගර්ය නිශ්චය කිරීම සඳහා මෙම මූලස්ථානය ඔබ දෙපාතර්මේන්තුව සමඟ අදහස් හුවමාරු කරගනිමින් සිටි බවට විගණකාධිපතිද දැනුවත් කරන ලදී.

8. තවද, 2017 දෙසැම්බර් මස 27 වන දින පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී, විගණකාධිපති විසින් සීමාසහිත හෙලිටුවසර් (පුද්) සමාගමෙහි ගිණුම් ප්‍රකාශ (2016/2017) සහතික කිරීම සඳහා නිශ්චිත කොටස් ප්‍රතිශතයක් භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුව වෙත පැවරිය යුතු බවට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) විසින් පෙන්වා දෙන ලදී.

9. කරුණු එසේ හෙයින් මෙම සමාගමෙහි වතර්මාන තත්වය නිරාකරණය කරගැනීම හා එහි මූල්‍ය හා ගිණුම්කරණ වගකීම් සපුරාලීම සඳහා ඔබගේ කාරුණික උපදෙස් අපේක්ෂා කරමි.

(කේ වී බී ජයම්පති)
ඩබ්ලිව්ඩබ්ලිව්වී,ආඩර්බ්ලිව්පී,(සිව්වරක්)ආඑර්ස්පී,වී එස්වීයූඑස්,පීඋපායමාගරීක) එම්එම්එස්සී,
,(චීනය)එෆ්එන්ඩීයූ(චීනය -අධ්‍යයනකිව්එච්අයි
එයාර් මාෂර්ල්
ගුවන් හමුදාධිපති

පරිශිෂ්ඨ "2"
2019.07 ..... දිනැති
අංක MOD/FD/DG(A&F)/AQ/19 දරණ ලිපිය

2018 ජුලි මස 25 වන දින

එයාර් මාෂර්ල්
ගුවන් හමුදාධිපති,

හිතවත් මහත්මයාණෙනි,

සමාගම් කොටස් වල හිමිකාරිත්වයේ සංයුතියPV) සමාගම (පුද්ගලික) සීමාසහිත හෙලිටූවසර් - (72768

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමු කල අංක ශ්‍රීලංගුහ/c.99/6/3/ගුමෙඅ දරණ 2018 ඔබගේ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡ ,දිනැති ලිපිය 24 ජනවාරි ා හා දුරකථන සංවාද කිහිපය හා බැදේ.

(2) 4 දරන සමාගම් පනතෙහි 07 අංක 2007වගන්තිය ප්‍රකාරවභාණ්ඩාගාර ලේකම් හට රජය සතු ,) සමාගම් වල තනි කොටස්single own shares) වල හිමිකාරිත්වය දැරීමට අනුමැතිය ඇති අතර මෙම ආයෝජන පිලිබඳ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ගිණුම් වල පැහැදිලිව දක්වා ඇතරාජ්‍ය ගිණුම්හි සඳහන්ව ,එසේම. නොමැති රජය සතු ව්‍යාපාර හඳුනාගැනීමේදී විගණකාධිපති හට ගැටළු ඇති විය හැකි සේම රජයේ ආයෝජන ලෙස රජයේ මුදල් යෙදවීමේදී පාරදෘශ්‍යභාවය හා වගවීම සම්බන්ධ ගැටළු ද උද්ගත විය .හැක

එබැවින් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පසු ,කඩිනමින් අදාළ සමාගම් කොටස් භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරීමට අවශ්‍ය කටයුතු සලසන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මීට විශ්වාසී,

එන්කේ නෙම්මවත්ත.ජී .කේ .
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත ආරක්ෂක අමාත්‍යංශය ,ලේකම් :

පරිශිෂ්ඨ "3"
2019.07 ..... දිනැති
අංක MOD/FD/DG(A&F)/AQ/19 දරණ ලිපිය

මගේ අංකය ශ්‍රීලංගුහ:/C.99/6/3/ ගුමෙඅ 04 සැප්තැම්බර් මස 2018
දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුව
භාණ්ඩාගාර දෙපාතර්මේන්තුව
ලෝටස් පාර
කොළඹ 01

සමාගම් කොටස් වල හිමිකාරිත්වයේ සංයුතිය(පුද්ගලික) සීමාසහිත හෙලිටුවසර් - සමාගම PV) (72768

යොමු:

අ. දිනැති රාජ්‍ය ගිණුම් පිලිබඳ කාරක සභා වාතර්‍ාව 24 ජුනි 2016
ආ. අංක S17/REP/2016 හා දිනැති ලිපිය 31 ඔක්තෝම්බර් 2016
ඇ. අංක S17/01/Com/Aud/2016-11/16 හා දිනැති ලිපිය 06 ජනවාරි 2017
ඈ. වන දින නියෝජ්‍ය විගණකාධිපති 29 නොවැම්බර් 2017 සමඟ ශ්‍රී ලංකා ගුවන් හමුදා මුලස්ථානයේදී පැවති රැස්වීම
ඉ. අංක ශ්‍රීලංගුහ/165/5/ගුමෙඅ හා දිනැති ලිපිය 08 දෙසැම්බර් 2017
ඊ. අංක ශ්‍රීලංගුහ/165/5/ගුමෙඅ හා දිනැති ලිපිය 20 දෙසැම්බර් 2017
උ. දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 27 දෙසැම්බර් 2017
ඌ. 2018 අගෝස්තු දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුවේ ලිපිය 25

1. ඉහත යොමුව "ඌ"මගින් උපදෙස් ලබා දී ඇති පරිදි, සීමාසහිත හෙලිටුවසර් (පුද්) සමාගම රජය සතු සමාගමක්ය යන්න සනාථ කිරීම සඳහා එහි කොටස් භාණ්ඩාගාර ලේකම් වෙත පැවරීමට නියමිතය.

2. කෙසේ නමුත් ඉහත යොමුගත ලිපියෙහි සමාගම් කොටස් පැවරීමේ ප්‍රතිශතය පිළිබඳව සඳහන් වී නොමැත.එසේ හෙයින්, මෙම සමාගම් කොටස් වලින් 51% ක ප්‍රමාණයක් භාණ්ඩාගාර ලේකම් වෙත පැවරීමට අපේක්ෂා කරන අතර ඉතිරි 49% ක ප්‍රමාණය ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව පවතී.

3. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඔබගේ කාරුණික උපදෙස් පතමි.

(කේ වී බී ජයම්පති)
ඩබ්ලිව්ඩබ්ලිව්වී,ආඩර්බ්ලිව්පී,(සිව්වරක්)ආඑර්ස්පී,වී එස්වීඋපායමාගර්ීක) එම්එම්එස්සී,යූඑස්පී, ,(චීනය)එෆ්එන්ඩීයූ(චීනය -අධ්‍යයනකිව්එච්අයි
එයාර් මාෂර්ල්
ගුවන් හමුදාධිපති

පරිශිෂ්ඨ "4"
2019.07 ..... දිනැති
අංක MOD/FD/DG(A&F)/AQ/19 දරණ ලිපිය

මගේ අංකය ශ්‍රීලංගුහ/C.99/6/3/ ගුමෙඅ — දින 27 මාතර්ු මස 2019

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුව
භාණ්ඩාගාර දෙපාතර්මේන්තුව
ලෝටස් පාර
කොළඹ 01

සමාගම් කොටස් භාණ්ඩාගාරය වෙත පැවරීම
සීමාසහිත හෙලිටුවසර් (PV 72768) සමාගම (පුද්ගලික)

යොමු:
අ. අංක ශ්‍රීලංගුහ/165/5/ගුමෙඅ හා දිනැති ලිපිය 24 ජනවාරි 2018
ආ . අංක ශ්‍රීලංගුහ/165/5/ගුමෙඅ හා දිනැති ලිපිය 08 සැප්තැම්බර් 2018
ඇ . දිනැති ලිපිය 25 ජුලි 2018 රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුව විසින් යොමු කල
ඈ. රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුවේ නිලධාරීන් සමඟ දින පැවති රැස්වීම 24 ජනවාරි 2019
ඉ. රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුවේ නිලධාරීන් සමඟ දින පැවති රැස්වීම 19 මාතර්ු 2019
ඊ. දින පැවති රාජ්‍ය ගිණුම් පිලිබඳ කාරක සභා රැස්වීම 21 මාතර්ු 2019

1. 2019 මාතර්ු මස 21 වන දින පැවති රාජ්‍ය ගිණුම් පිලිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් උපදෙස් අනුව හෙලිටුවසර් හි කොටස් භාණ්ඩාගාර ලේකම් වෙත පැවරීමේ කටයුතු අවසන් කිරීමටත් එම සමාගම රජය සතු සමාගමක් ලෙස නියාමනය කිරීමටත් අවශ්‍යව ඇත.

2. ඒ අනුව, ගුවන් හමුදා මුලස්ථානයේ සීමාසහිත හෙලිටුවසර් (පුද්) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෙලිටුවසර් සඳහා සුදුසු ව්‍යාපාරික ආකෘතියක් හඳුනාගැනීම පිණිස රාජ්‍ය ව්‍යාපාර දෙපාතර්මේන්තුවේ අදාළ නිලධාරීන් සමඟ 2019 අප්‍රේල් මස 10 වන දින 1000 පැයට රැස්වීමක් සූදානම් කිරීමට බලාපොරොත්තු වේ.

3. එබැවින්, හැකි ඉක්මනින් ඒ සඳහා අදාළ නිලධාරීන් නම් කර රැස්වීම් දිනය ස්ථිර කරන මෙන් ඉල්ලා සිටිමි.

4. අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

(ඩී එල් එස් ඩයස්)
එයාර් වයිස් මාෂර්ල්
මණ්ඩලික ප්‍රධානි
ගුවන්හමුදාධිපති වෙනුවට

පරිශිෂ්ඨ "5"
2019.07 ..... දිනැති
අංක MOD/FD/DG(A&F)/AQ/19 දරණ ලිපිය

මගේ අංකය: පීඊඩී/එස්/එච්ටී/1/12(i) 2019 අප්‍රේල් මස 09 වන දින

ගුවන්හමුදාධිපති,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව.

<u>සමාගම් කොටස් භාණ්ඩාගාරය වෙත පැවරීම</u>
<u>සීමාසහිත හෙළිටුවසර් (PV 72768) සමාගම (පුද්ගලික)</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක ශ්‍රීලංගුහ/C.99/6/3/ගුමෙඅ දරණ දිනැති 27 මාතර්‍ු 2019 .ලිපිය හා බැඳේ

කලින් සැලසුම් කරගත් රැස්වීමක් එම දිනයට සහ වේලාවටම යෙදී තිබීම හේතුවෙන්, මෙම විෂය සම්බන්ධයෙන් දැනුමැති නිලධාරියා හට වන දින පැවැත්වීමට නියමිත රැස්වීමට 10 අප්‍රේල් මස 2019 සහභාගී වීමට නොහැකි බව කාරුණිකව දැනුම් දෙමි.

මේ සම්බන්ධයෙන් යම් අපහසුතාවක් සිදු වූයේනම් අපගේ කණගාටුව ප්‍රකාශ කරමු.

ඩී සී ඩබ් හපුගොඩ
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ ජනරාල් *වෙනුවට*

පරිශිෂ්ඨ "6"
2019.07 ..... දිනැති
අංක MOD/FD/DG(A&F)/AQ/19 දරණ ලිපිය

රාජ්‍ය ගිණුම් කාරක සභාව සඳහා වාණිජ පදනම මත සපයා ඇති ගුවන් ගමන් පහසුකම් වෙනුවෙන් ගුවන් හමුදාවට අයවිය යුතු රු. මිලියන 13.47 ක හිග මුදල අයකර ගැනීමේ වර්තමාන ප්‍රගතිය

අනු අංකය	ආයතනය	2016.12.31 වන දිනට හිග මුදල (රු)	2017.12.31 වන දිනට හිග මුදල (රු)	2019.03.18 වන දිනට හිග මුදල (රු)	වර්තමාන තත්වය
01	එරෝ ලංකා පුද්ගලික සමාගම	122,813.47	122,813.47	122,813.47	මෙම පෞද්ගලික ආයතන වලින් ලැබිය යුතු හිග ආදායම් අයකර ගැනීම සදහා අධ්‍යක්ෂක නීති මගින් නීතිපති දෙපාර්තමේන්තුව මගින් අයකර ගැනීමේ ක්‍රියා මාර්ග ගැනීම සදහා යොමුකර ඇත.
02	ලයන් එයාර් පුද්ගලික සමාගම	3,489,852.50	3,489,852.50	3,489,852.50	
03	අධ්‍යාපන අමාත්‍යාංශය	555,969.60	555,969.60	-	අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ගුවන් හමුදාව වෙත පියවීමට තිබූ මුදල 2018 නොවැම්බර් මස 28 වන දින ගුවන් හමුදාව වෙත පියවා ඇත.
04	රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශය	595,570.23	595,570.23	595,570.23	2018 ජූනි මස 21 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේ රැස්වීමේදී ලබා දුන් උපදෙස් අනුව මෙම රාජ්‍ය ආයතන වෙත ගුවන් හමුදාවවෙත පියවීමට ඇති හිග මුදල් ගෙවන ලෙස දන්වමින් 2019 ජනවාරි මස 31 වන දින ගුවන් හමුදාධිපතිතුමාගේ අත්සනින් ලිපි යොමු කර ඇත. මේ සම්බන්ධව වූ සාකච්ජාවක් 2019 මාර්තු මස 13 වන දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවේදී පැවැත්විනි. එම සාකච්චාවේ වාර්ථා පත්‍රය මේ දක්වා ගුවන් හමුදාව වෙත යොමුකර නැත. එම වාරථාවෙ අඩංගු තිරණ ලැබිමෙන් පසු ඔබ අංශය වෙත ලබා දිමට කටයුතු කරණු ලැබේ.
05	නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය	836,165.00	836,165.00	836,165.00	
06	මහානගර සභා හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	542,454.59	542,454.59	542,454.59	
07	කම්කරු හා වෘත්තිය සමිති සබදතා අමාත්‍යාංශය	720,225.52	720,225.52	720,225.52	
08	ධිවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය	75,690.00	75,690.00	75,690.00	

<table>
<tr><th>අනු අංකය</th><th>ආයතනය</th><th>2016.12.31 වන දිනට හිග මුදල (රු)</th><th>2017.12.31 වන දිනට හිග මුදල (රු)</th><th>2019.03.18 වන දිනට හිග මුදල (රු)</th><th>වර්තමාන තත්වය</th></tr>
<tr><td>09</td><td>වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය</td><td>416,002.34</td><td>416,002.34</td><td>416,002.34</td><td>වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය වෙත ගුවන් ගමන් සැපයූ බවට තහවුරු කිරීමට අවශ්‍ය ලියවිලි නොමැතිවීම හේතුවෙන් ඉදිරි කටයුතු කිරීමට නොහැකිවී ඇත.

මේ සම්බන්ධව වූ සාකච්ඡාවක් 2019 මාර්තු මස 13 වන දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවේදී පැවැත්විනි. එම සාකච්චාවේ වාර්ථා පත්‍රය මේ දක්වා ගුවන් හමුදාව වෙත යොමුකර නැත. එම වාරථාවෙ අඩංගු තිරණ ලැබීමෙන් පසු ඔබ අංශය වෙත ලබා දිමට කටයුතු කරණු ලැබේ.</td></tr>
<tr><td>10</td><td>ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය</td><td>907,816.31</td><td>907,816.31</td><td>-</td><td>MOD/SUP/9/04/1/2016 දරණ 2019 පෙබරවාරි මස 11 දිනැති ලිපිය මගින් මෙම හිග මුදල මු.රෙ. 109 යටතේ ආරක්ෂක ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති බවත් ඒ අනුව මුදල් අධ්‍යක්ෂක කර්යාලය මගින් 2019 මාර්තු මස 15 වැනි දින එවන ලද SLAF/325/CA10/HELI/02/2019(05) දරණ ලිපිය මගින් හිග ආදායම් ලේඛනයෙන් ඉවත් කර ගැනීමට කටයුතු කර ඇත.</td></tr>
<tr><td>11</td><td>විදේශ කටයුතු අමාත්‍යාංශය</td><td>1,621,254.34</td><td>1,621,254.34</td><td>1,621,254.34</td><td rowspan="2">හිග ආදායම් මුදල වන රු.4,019,353.99 ක මුදල අයකර ගැනීම උදෙසා අදාල ආයතන වලට සිහි කැඳවීම් යොමු කර ඇත.අවසාන වරට 2018 ජූලි මස 31 වන දින SLAF/99/4/DAO මගින් යොමුකර ඇත.තවද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව හා මූල්‍ය අපරාධ කොට්ඨාශය වෙත ලැබුණු පැමිණිලි මත අදාල විමර්ශනය සඳහාද අවශ්‍ය තොරතුරු මේ වන විටත් ඉදිරිපත් කර ඇත.

මේ සම්බන්ධව වූ සාකච්ජාවක් 2019 මාර්තු මස 13 වන දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවේදී පැවැත්විනි. එම සාකච්චාවේ වාර්ථා පත්‍රය මේ දක්වා ගුවන් හමුදාව වෙත යොමුකර නැත. එම වාරථාවෙ අඩංගු තිරණ ලැබීමෙන් පසු ඔබ අංශය වෙත ලබා දිමට කටයුතු කරණු ලැබේ.</td></tr>
<tr><td>12</td><td>ජනාධිපති ලේකම් කාර්යාලය</td><td>2,398,099.65</td><td>2,398,099.65</td><td>2,398,099.65</td></tr>
</table>

අනු අංකය	ආයතනය	2016.12.31 වන දිනට හිඟ මුදල (රු)	2017.12.31 වන දිනට හිඟ මුදල (රු)	2019.03.18 වන දිනට හිඟ මුදල (රු)	වර්තමාන තත්වය
13	ගරු අමාත්‍ය ස්වාමිනාදන්	1,009,528.36	-	-	ගරු අමාත්‍ය ස්වාමිනාදන්ගේ හිඟ මුදල වන රු.1,009,528.36 සඳහා චෙක්පත් අංක 114763 මගින් ගෙවා ඇති අතර ඒ සඳහා 2017.01.05 වන දින ආකෘති පත්‍ර 743 අංක 188654 නිකුත් කර ඇත.
14	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	116,000.00	-	-	ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ හිඟ මුදල වන රු.116,000.00 සඳහා 2017.01.03 වන දින රු.58,000.00 ක් ගෙවා ඇති අතර ඒ සඳහා 2017.01.03 වන දින ආකෘති පත්‍ර 743 අංක 188649 නිකුත් කර ඇත.2017.06.12 වන දින රු.58,000.00ක් ගෙවා ඇති අතර ඒ සඳහා ආකෘතිපත්‍ර 743 අංක 188970 නිකුත් කර ඇත.
15	නීතිය සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය	-	432,535.00	-	නීතිය සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ හිඟ මුදල සඳහා 2018.01.17 වන දින රුපියල් 432,535.00ක් ගෙවා ඇති අතර ඒ සඳහා 2018.01.18 වන දින ආකෘතිපත්‍ර 743 අංක 189429 නිකුත් කර ඇත.
16	නීතිය සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය	-	383,488.60	-	නීතිය සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ හිඟ මුදල සඳහා 2018.02.02 වන දින රුපියල් 383,488.60ක් ගෙවා ඇති අතර ඒ සඳහා 2018.02.05 වන දින ආකෘතිපත්‍ර 743 අංක 189477 නිකුත් කර ඇත.
එකතුව		13,407,442.21	13,097,937.45	10,818,127.64	

පරිශිෂ්ඨ "7"
2019.07 ..... දිනැති
අංක MOD/FD/DG(A&F)/AQ/19 දරණ ලිපිය

සීමාන්විතයි

ශ්‍රීලංගුහ/477/2/සංවිධාන

2019 මාර්තු මස [illegible] වන දින

අධ්‍යක්ෂ ජනරාල්
නාගරික සංවර්ධන අධිකාරිය
සෙත්සිරිපාය
බත්තරමුල්ල

<u>ගුවන් හමුදා ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා ඉඩම් පවරා ගැනීම - අක්කර 1, රූඩ් 0, පර්චස් 01.50 (හෙක්ටයාර 0.4085)</u>

යොමු:
අ. 2018 අගෝස්තු මස 8 දිනැති කැබිනට් මණ්ඩල තීරණය
ආ. 2019 මාර්තු මස 21 දින පාර්ලිමේන්තුවේදී පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග හා සබැඳේ
ඇ. 2019 මාර්තු මස 25 දිනැති ලේකම් රාජ්‍යයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය අමතන ලද ලිපිය

1. දිනෙන් දින කොළඹ නගරය තුළ ඉදි වෙමින් පවතින මහල් ගොඩනැගිලි හා අනෙකුත් මහා පරිමාණ ඉදිකිරීම් සඳහා නිසි ගිනි ආරක්ෂණයක් ලබාදීම කාලීන ජාතික අවශ්‍යතාවයකි. ඒ සඳහා මේ වන විටත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව පෙරමුණ ගෙන ඇති අතර ගුවන් හමුදා ගිනි නිවීමේ ඒකකය ස්ථාපිත කිරීම සඳහා නාරාහේන්පිට මන්සංදියේ පිහිටි බේකරියවත්ත නැමති රජයේ ඉඩම ගුවන් හමුදාව වෙත පැවරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත.

2. එමෙන්ම, මෙම ඉඩමෙහි පදිංචිව සිටි පවුල් එම ස්ථානයෙන් ඉවත් කිරීම සඳහා දරා ඇති රුපියල් මිලියන 192ක මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතුව ඇත. ඒ සඳහා මූලිකව රුපියල් මිලියන 50ක මුදලක් 2019 වර්ෂයේ රාජ්‍ය අයවැය මගින්ද ඉතිරි මුදල වූ රුපියල් මිලියන 142ක මුදල 2020 වර්ෂයේ රාජ්‍ය අයවැය මගින්ද ලබා දීමට එකඟ වී ඇත.

3. තවද, ඉහත යොමුව "ඇ" පරිදි 2019 මාර්තු මස 21 දින පාර්ලිමේන්තුවෙහි පැවති රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීමේදී සභාපති රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ගිනි නිවීමේ ඒකකයක් ස්ථාපිත කිරීම කාලීන අවශ්‍යතාවයක් බව අවධාරණය කරන ලදී. එබැවින්, මෙම ඉඩම් කොටස ගිනි නිවීමේ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා ගුවන් හමුදාව වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස නියෝග කරන ලදී.

4. ඒ අනුව, ඉහත කරුණු සියල්ල සැලකිල්ලට ගෙන නාරාහේන්පිට මන්සංදියේ පිහිටි බේකරියවත්ත නැමති රජයේ ඉඩම ගුවන් හමුදාව වෙත පැවරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකර දෙනමෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

(පීඩීකේවී ජයසිංහ)
එයාර් වයිස් මාර්ෂල්
පරිපාලන අධ්‍යක්ෂක
ගුවන් හමුදාපති වෙනුවට

<u>පිටපත</u>

ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
අංක 15/5, බාලදක්ෂ මාවත
කොළඹ 03

සීමාන්විතයි

පරිශිෂ්ඨ "8"
2019.07 ..... දිනැති
අංක MOD/FD/DG(A&F)/AQ/19 දරණ ලිපිය

ශ්‍රීලංගුහ/සී.438/23/නීති 2018 ජුනි 22 දින

ලේකම්,
රාජ්‍ය ගිණුම් කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

<u>**ශ්‍රී ලංකා ගුවන්හමුදාවේ F-7 ගුවන්යානාවකට අයත් ඇන්ටනා ස්කෑනරය සහිත රේඩාර් ප්‍රතිග්‍රාහකය(radar receiver with antenna scanner) අස්ථාන ගත වීම**</u>

යොමුව: 2018 ජුනි මස 21 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාමර අංක 06 හි පැවති රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීම් සටහන්

1. ශ්‍රී ලංකා ගුවන්හමුදාවේ F-7 ගුවන්යානයකට අයත් ඇන්ටනා ස්කෑනරය සහිත රේඩාර් ප්‍රතිග්‍රාහකය අස්ථාන ගත වීමට අදාළව රාජ්‍ය ගිණුම්කාරක සභාවේ සභාපති ගේ නියෝග පරිදි මෙතෙක් ක්‍රියාත්මක කරන ලද නීතිමය කාර්යයන්ගේ ප්‍රගතිය පහත දක්වා ඇත.

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඉහත උදෘත කරුණ සම්බන්ධව **2015 අප්‍රේල් 17** දාතමින් යුත් SLAF/C.436/ 14/ LEG අංක දරන ලිපිය මඟින් නීතිපතිගේ උපදෙස් පතා ඇති අතර එය "ඇමුණුම අ" ලෙස මේ සමඟ අමුණා ඇත. එම යොමුගත ලිපිය මෙම කරුණ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ගයන්ගේ සාරාංශය වඩාත් විස්තරාත්මකව දක්වා ඇත.

ආ. 2015 අගෝස්තු 20 වන දින ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුරංග විමලසේන මයා සමඟ නීතිපති දෙපාර්තමේන්තුවේදී උපදෙස් සාකච්ඡාවක් සිදු කරන ලද අතර ඊට විධායක නීති අංශයේ බලසන නායක පී.අයි සමරවීර සහ විධායක ප්‍රසම්පාදන අංශයේ 'බලසන නායක ආර්.ජේ ප්‍රියශාන්ත යන නිලධාරීන් සහභාගී විය.

ඇ. එම සාකච්ඡාවේදී ඉදිරිපත් වූ කරුණු අනුව , F-7 ගුවන්යානයේ අස්ථානගත වී ඇති අයිතමය යම් ලෙසකින් ත්‍රස්ත කණ්ඩායමක් අතට පත් වුවහොත් එය ජාතික හා ගෝලීය ආරක්ෂාවට තර්ජනයක් වන බවත් එවැනි සිදුවීමක් සිදු වුවහොත් එය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රතිරූපය බිඳ වැටීමට ද හේතු වන බවත් දක්වමින් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ පැමිණිල්ලක් පවරන ලෙස ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයා විසින් උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීම මඟින් අදාළ අයිතමය අස්ථානගත වීම පිළිබඳ මූලික අනාවරණයන් සිදු කරගත හැක. එමෙන්ම අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ විමර්ශනයන් හා සමගාමීව අදාළ ගැල්කුලී නිශ්කාෂන ආයතනයට එරෙහිව අලාභ අයකරගැනීමේ ක්‍රියාමාර්ගයක්ද ආරම්භ කළ හැක.

ඈ. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූලව විධායක ප්‍රසම්පාදන අංශය මඟින් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. මේ වන විටත් ගැල්කුලී නිශ්කාෂන ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නීතිමය ක්‍රියාමාර්ග වහා කඩිනම් කිරීම හා වැඩිදුර විමර්ශනයන් සිදු කිරීමට අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත අදාළ කරුණ යොමු කිරීම සඳහා ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය 2015 අගෝස්තු 03 දින ලබා දී ඇත. අනුමැතිය ලබා දුන් බව දැක්වෙන ලිපිය "ඇමුණුම ආ"ලෙස මේ සමඟ අමුණා ඇත. අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම විධායක ප්‍රසම්පාදන අංශය මඟින් විධායක නීති අංශය වෙත යොමු කල 2016 මැයි 31 දිනැති පැමිණිල්ල "ඇමුණුම ඇ" ලෙස මේ සමඟ අමුණා ඇත.

2. ඔබගේ දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

අත්සන් කලේ: **(එස් එන් එස් එන් ඩයස්)**
ගෲප් කපිතාන්
අධ්‍යක්ෂ නීති
ගුවන් හමුදාධිපති වෙනුවට

'ඇමුණුම අ
ශ්‍රීලංගුහ /සී.438/23/නීති
2018 ජුනි මස 22 වන දින'

ශ්‍රී ලංගුහ/සී.436/14/නීති 2015 ජුනි 17 දින

නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් අස්ථානගත වූ ප්‍රේෂණය කරන ලද භාණ්ඩය සම්බන්ධව නීතිමය උපදෙස් හා සහය පැතීම

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාව (ප්‍රේෂණකරු), මෙයින් මතුවට "ප්‍රේෂණය කරන ලද භාණ්ඩය" වශයෙන් සඳහන් කරන ගුවන්යානා කොටස් කිහිපයක් චීනයේ බීජිං නුවර වයිනා නැෂනල් එරෝ ටෙක්නොලොජි (ප්‍රේෂණලාභියා) වෙත අලුත්වැඩියාව සඳහා යැවීමට අංක 339, ගාලු පාර, කොළඹ 03 යනු ලිපිනයෙහි පිහිටි කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම නම් දේශීය ගැල්කුලී නිශ්කාෂන ආයතනයෙන් සේවය ලබාගෙන ඇත.

2. චීනයට යැවීමට තිබූ ප්‍රේෂණය කරන ලද භාණ්ඩය පිළිබඳ විස්තර පහත පරිදි වන අතර එහි වටිනාකම ඇ.ඩො.536,000.00 කි (නවතම මිල).

3. කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම ආයතනය ඉහත සඳහන් ප්‍රේෂණය කරන ලද භාණ්ඩය චීනයේ එහි ගමනාන්තය වෙත ප්‍රවාහනය කරවීම සඳහා ගුවන් භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ලෙස අයකරගත් මුදල රු. **19,144.35** කි.

4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙම ප්‍රේෂණය කරන ලද භාණ්ඩය 2014 අප්‍රේල් මස 24 වන දින චීනයට යැවීම සඳහා කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම වෙත භාර දී ඇති අතර කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම ආයතනය ප්‍රකාශ කර සිටින්නේ ඔවුන් එය චීනය වෙත ප්‍රවාහනය කිරීම සඳහා එයාර් ඒෂියා එක්ස් කාර්ගෝ නම් ගුවන් සමාගම වෙත 2014 අප්‍රේල් 25 දින භාර දුන් බවත් පසුව ප්‍රේෂණලාභියා විසින් සනාථ කරන පරිදි එම ප්‍රේෂණය කරන ලද භාණ්ඩය චීනයේ යා යුතු ගමනාන්තය වෙත ලඟා වී නොමැති බවට අනාවරණය වූ බවත් ය.

5. ප්‍රේෂණය කරන ලද භාණ්ඩය, ගුවන්තොටුපොළින් ගුවන්තොටුපොළට ප්‍රවාහනය කිරීම යන පදනම මත එයාර් ඒෂියා ගුවන් සමාගමේ ගුවන්යානය වෙත බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහිදී ලබා දීමෙන් අනතුරුව එය චීනය වෙත යැවීමට නියමිතව තිබුනේ මැලේසියාවේ ක්වාලාලම්පූර් හුවමාරුව හරහාය.

6. අස්ථානගත වී ඇති බවට සැක කරන මෙම ප්‍රේෂණය කරන ලද භාණ්ඩය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ රේඩාර් පද්ධතිය සඳහා භාවිතා කරන උපකරණයක් වන අතර එය වෙනත් අදාළ නොවන පාර්ශවයක් අතට පත් නොවිය යුතු අධි ආරක්ෂිත යුධ උපකරණයකි.

7. ශ්‍රී ලංකා ගුවන් හමුදාව දිගින් දිගටම මෙම ප්‍රේෂණය කරන ලද භාණ්ඩය පිළිබඳව දේශීය ගැල්කුලී නිශ්කාෂන ආයතනය වන කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම වෙතින් විමසීම් කළද ඊට ඔවුන් සතුටුදායක මට්ටමේ ප්‍රතිචාර දක්වා නොමැත.

8. කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම එයාර් ඒෂියා කාගෝ ගුවන් සමාගම විසින් සිදු කළ ප්‍රකාශය මත රැඳෙමින් පවසා සිටින්නේ එයාර් ඒෂියා කාගෝ වෙත අදාළ භාණ්ඩය භාරදීමෙන් පසු ක්වාලාලම්පූර් හිදී එය අස්ථානගත වී ඇති බවත් ඔවුන්ට එය තිබෙන ස්ථානය හඳුනාගත නොහැකි බවත්ය. නමුත් මෙම ප්‍රකාශය පිළිගත නොහැකි වන්නේ එහි සත්‍යතාව තහවුරු කිරීම සඳහා කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ප්‍රමාණවත් ලියකියවිලි ලබා දී නොමැති බැවිනි.

9. අවසානයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙම භාණ්ඩය තිබෙන ස්ථානය හඳුනාගැනීම සඳහා මැලේසියාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයාගේ ද සහය ඉල්ලා සිටි නමුත් ඔවුන්ට ද එය සොයා ගැනීමට අපොහොසත් විය.

10. සෙවුම් පද්ධතියක් හරහා එක්රැස් කරගත් තොරතුරු අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව අනාවරණය කරගත් කරුණ වන්නේ අදාළ ගුවන් සමාගම මෙම ප්‍රේෂණය කරන ලද භාණ්ඩය ක්වාලාලම්පූර් හුවමාරුව හා චීනයෙහි එහි ගමනාන්තය වෙත ප්‍රවාහනය සඳහා ගුවන් ප්‍රවාහන පහසුකම් වෙන් කරවා තිබී ඇති නමුත් එම භාණ්ඩය අදාළ ස්ථාන වෙත ගුවනින් ප්‍රවාහනය කරන ලද බව දැක්වීමට කිසිදු සාක්ෂියක් නොමැති බවයි.

11. ප්‍රේෂණය කරන ලද භාණ්ඩය තිබෙන ස්ථානය නිශ්චිතවම හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව ගත් සියලුම උත්සාහයන් ව්‍යර්ථ වූ අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ප්‍රේෂණය කරන ලද භාණ්ඩයේ භාරකාරීත්වය ලබාදුන් ගැල්කුලී නිශ්කාෂන ආයතනය මඟින් අස්ථානගත වීම සම්බන්ධයෙන් කිසිදු වලංගු හේතුවක් ලබා නොදුන් නමුත් අස්ථානගත වූ භාණ්ඩය සඳහා රක්ෂණාවරණය හරහා අලාභ ගෙවීමට එකඟ වී ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ගැල්කුලී නිශ්කාෂන ආයතනයේ අලාභ ගෙවීම භාර ගැනීමට කිසිදු අරමුණක් නොමැත. මන්ද යත් ගැල්කුලී නිශ්කාෂන ආයතනය අදහස් කරන්නේ ප්‍රේෂණය කරන ලද භාණ්ඩයේ රක්ෂිත මුදලට සමාන මුදලක් ගෙවීමට පමණක් වන අතර උක්ත රක්ෂිත මුදල අස්ථානගත වූ භාණ්ඩයේ නියා වටිනාකමට වඩා බෙහෙවින් අඩුය.

12. ටෙන්ඩර් කොන්දේසි සඳහන් ලේඛනයේ ඡේද අංක 02 ප්‍රකාරව ප්‍රේෂණය කරන ලද භාණ්ඩය හානි වීම, නැති වීම හා අස්ථානගත වීම සම්බන්ධ පූර්ණ වගකීම ගැල්කුලී නිශ්කාෂන ආයතනය දැරිය යුතුය. උක්ත ටෙන්ඩර් ආකෘතිය "ඇමුණුම ල" ලෙස මෙහි අමුණා ඇත.

13. ඉහත තත්ත්වය සලකා මෙම භාණ්ඩය ප්‍රවාහනය හා සම්බන්ධ පාර්ශවයන්ගෙන් අස්ථානගත වූ භාණ්ඩයේ වටිනාකම ආපසු අයකරගැනීමට ඔබගේ නෛතික උපදෙස් හා සහය කාරුණිකව ඉල්ලා සිටිමි.

14. ඔබගේ දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

අත්සන් කළේ: එස් එන් එස් එන් ඩයස්
විංග් කමාන්ඩර්
අධ්‍යක්ෂ නීති
ගුවන් හමුදාධිපති වෙනුවට

'ඇමුණුම ආ
ශ්‍රීලංගුහ /සී.438/23/නීති
2018 ජුනි මස 22 වන දින'

ලුහුඬු සටහන්

PD/1360/1/EQ(SR/8036)

අධ්‍යක්ෂ නීති මගින්,
ගුවන් හමුදාධිපති

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් අස්ථානගත වූ ප්‍රේෂණය කරන ලද භාණ්ඩය හා සම්බන්ධ කාර්යයන්

යොමු:
ඇ. ටෙන්ඩර් ගොනුව AHQ/I4/LS BRK/1022 (SR-8036)
ආ. M-04 of AHQ/I4/LS BRK/1022 අධ්‍යක්ෂ නීති සටහන

1. ඇන්ටනා ස්කෑනරය (LRU-01) සහිත රේඩාර් ප්‍රතිග්‍රාහකය (LRU-02) විදේශීය අලුත්වැඩියාව සඳහා යැවීමේ ක්‍රියාවලිය අතරතුරදී අස්ථාන ගත වී ඇත. විස්තර මේ සමඟ අමුණා ඇති "ඇමුණුම අ" හි සඳහන් වේ.

2. ASD Export කාර්ය මණ්ඩලයේ විෂය ලිපිකරුවකු විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේදී ප්‍රේෂණය කරන ලද භාණ්ඩයට අදාළ අපනයන රේගු නිෂ්කාෂණ කටයුතු , කොළඹ පිහිටි කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම නම් ගැල්කුලී නිශ්කාෂන ආයතනයේ නියෝජිතයෙකුද සමඟ 2014 අප්‍රේල් මස 25 වන දින සිදු කර බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි ගුවන් භාණ්ඩ පර්යන්තයට, භාණ්ඩයේ අවසන් ගමනාන්තය වන චීනයේ බීජිං නුවර (චයිනා නැෂනල් එරෝ ටෙක්නොලොජි ඉම්පෝට් එක්ස්පෝට් කෝපරේෂන් - චයිනා) වෙත යැවීමේ අරමුණින් භාර දී ඇත. (කරුණාකර මිට "ඇමුණුම ආ" සහ "ඇ" බලන්න)

3. කෙසේ නමුත් ප්‍රසම්පාදන අංශය මඟින් සිදු කල පසු විපරම් ක්‍රියාවලිය අතරතුරදී මෙම ප්‍රේෂණය කරන ලද භාණ්ඩය එහි ගමනාන්තය වෙත ළඟාවී නොමැති බව අනාවරණය වූ අතර ප්‍රසම්පාදන අංශය ඒ පිළිබඳව ගැල්කුලී නිශ්කාෂන ආයතනයෙන් හා ගුවන් සමාගමෙන් ප්‍රථමයෙන් විමසීම් කර ඇත.

4. ගැල්කුලී නිශ්කාෂන ආයතනයෙන් හා ගුවන් සමාගමෙන් (එයාර් ඒෂියා කාගෝ) ලැබුණු තොරතුරු අනුව අදාළ භාණ්ඩය ක්වාලාලම්පූර් හිදී අස්ථාන ගත වී ඇති බවත් මේ දක්වා එය සොයා ගැනීමට අපොහොසත් ව ඇතිබවත් අනාවරණය වී ඇත. තවද එයාර් ඒෂියා කාගෝ බීජිං ගුවන් භාණ්ඩ පර්යන්ත කාර්යාලයද තම භාණ්ඩ ගබඩාවෙහි අදාළ ප්‍රේෂණය කරන ලද භාණ්ඩය නොතිබූ බවට තහවුරු කර ඇත. එමෙන්ම ප්‍රසම්පාදන අංශය විසින් ගැල්කුලී නිශ්කාෂන ආයතනයෙන් හා ගුවන් සමාගමෙන් දිගින් දිගටම මේ සම්බන්ධයෙන් විමසීම් කල අතර අස්ථානගත වූ භාණ්ඩය සොයා ගැනීම සඳහා මැලේසියාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයාගෙන්ද වැඩිදුරටත් සහය පතා ඇත.

5. එසේ වුවත් කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම නම් ගැල්කුලී නිශ්කාෂන ආයතනය අස්ථාන ගතවූ භාණ්ඩය සොයා ගැනීම සඳහා වැඩි අවධානයක් යොමු නොකළ නමුත් ඔවුන්ගේ රක්ෂණාවරණය හරහා අලාභය පියවීමට යෝජනා කරන ලද අතර එම මුදල (MYR 1,801.33 = LKR 63,163.02) භාණ්ඩයේ සත්‍ය වටිනාකමට වඩා බෙහෙවින් අඩුය.

6. තවද ගැල්කුලී නිශ්කාෂන ආයතනය යෝජනා කල පරිදි රක්ෂණ වන්දි ලබා ගැනීමට ප්‍රථම ප්‍රසම්පාදන අංශය විසින් මෙම භාණ්ඩය සොයා ගැනීම සඳහා හැකි සියලු උත්සාහයන් දැරූ බව සඳහන් කිරීම සුදුසුය. භාණ්ඩයේ මූල්‍ය වටිනාකම හැරුණු කොට එම භාණ්ඩය සොයා ගැනීමට හැකි සියලුම උත්සාහයන් දැරිය යුත්තේ එය අදාළ නොවන පාර්ශවයක් අතට පත් නොවිය යුතු සීමාන්විත රේඩාර් අයිතමයක් වන බැවිනි.

7. පසුව, කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම නම් ගැල්කුලී නිශ්කාෂන ආයතනයට එරෙහිව සුදුසු නීතිමය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීම සඳහා මෙම කරුණ 2015 අප්‍රේල් මස 07 වන දින අධ්‍යක්ෂ නීති වෙත යොමු කරන ලද අතර අධ්‍යක්ෂ නීති විසින් එය අවශ්‍ය නීතිමය උපදෙස් පතා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තවද අධ්‍යක්ෂ නීති විසින් මෙම කරුණ ශ්‍රී ලංකා ගුවන් හමුදා ඉහළ අධිකාරිත්වයේ අදාළ අනුමැතිය ද සහිතව අපරාධ විමර්ශ දෙපාර්තමේන්තුව වෙත වැඩිදුර විමර්ශනය සඳහා යොමු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

8. තවද, ශ්‍රී ලංකා ගුවන් හමුදා රක්ෂණ ක්‍රියාවලිය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ප්‍රසම්පාදන අංශය මඟින් ලබාගෙන තිබියදීත් පසුව දැනගැනීමට ලැබුණේ ඔවුන්ගේ ප්‍රමාදය හේතුවෙන් විදේශ අලුත්වැඩියා හා සේවා අංශයෙන් අදාළ රක්ෂණ සහතිකය ලබාගෙන නොමැති බවයි. එසේ හෙයින් මෙම කරුණට අදාලව රක්ෂණ හිමිකම් පෑමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නොහැකි විය.

9. ඒ අනුව මෙහිදී ක්‍රියාත්මක කල හැකි පහත සඳහන් කාර්යයන් යෝජනා කර ඇත.

අ. නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධව,

(1) ගැල්කුලී නිශ්කාෂන ආයතනයෙන් භාණ්ඩයේ මුළු වටිනාකම අය කර ගැනීමට හැකියාව තිබේද යන්න නිශ්චය කරගැනීම සඳහා කෙයාර් ලොජිස්ටික් පුද්ගලික සමාගම නම් ගැල්කුලී නිශ්කාෂන ආයතනයට එරෙහිව දැනට ගෙන ඇති නීතිමය පියවර කඩිනම් කිරීම.

(2) අස්ථාන ගත වී ඇති භාණ්ඩය සීමන්විත භාණ්ඩයක් බැවින් එය සොයා ගැනීමට වැඩිදුර විමර්ශන සඳහා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

ආ. ඉහත ඡේද අංක 08ද ඇතුළත්ව මෙම කරුණ විමර්ශනය සඳහා පරීක්ෂණ අධිකරණයක් කැඳවීම.

10. ඔබගේ කාරුණික අවධානය හා අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

2015 ජුලි මස 20 වන දින

අත්සන් කලේ: එස් එම් එස් පී කොස්වත්ත
ගෲප් කපිතාන්
ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී

ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය, තැ.පෙ. 59
இலங்கை விமானப்படைத் தலைமையகம், த.பெ. 594, கொழும்பு, இலங்கை.
SRI LANKA AIR FORCE HEADQUARTERS, P.O. Box 594, Colombo, Sri Lanka.

දුරකථනය/தொலைபேசி/Telephone — පොදු/பொது/General 2441044/2495495; සෘජු/நேரடி/Direct; දිගුව/இணைப்பு/Extension
ෆැක්ස්/பெக்ஸ்/Fax — පොදු/பொது/General 2441044/2495495; සෘජු/நேரடி/Direct; දිගුව/இணைப்பு/Extension
ඊ මේල්/மின்அஞ்சல்/e-mail

'ඇමුණුම ඈ
ශ්‍රීලංගුහ /සී.438/23/නීති
2018 ජූනි මස 22 වන දින'

ප්‍රඅ/ර.34/1/පී

2016 මැයි මස 7 වන දින

අධ්‍යක්‍ෂක
අපරාධ විමර්ෂණ කොට්ඨාශය
සිව්වන මහල
නව මහලේකම් ගොඩනැගිල්ල
කොළඹ.

<u>අපරාධ විමර්ෂණ කොට්ඨාශයේ පැවරීමට නියමිත පැමිණිල්ල</u>

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් F – 07 ප්‍රහාරක යානාවකට අයත් Radar Receiver නමින් හඳුන්වන කොටයක් විනයට ගුවන් මඟින් සැපීමේ දී නැති වීම සම්බන්ධයෙන් ඔබ අංශය වෙත වාචික පැමිණිල්ලක් කිරීම සඳහා ඉදිරිපත් වූ අතර එය ලිඛිතව සිදු කල යුතු බව උපදෙස් ලද අතර ඒ සඳහා වූ ලිඛිත පැමිණිල්ල මේ සමඟ අමුණා එවා ඇත.

2. ඔබගේ නිසි සඳහා ඉදිරිපත් කෙරේ.

(එස් එම් එස් පී කොස්වත්ත)
ගෲප් කැප්ටන්
ප්‍රධාන ප්‍රසම්පාදන නිළධාරි

අපරාධ විමර්ශන කොට්ඨාශයේ පැවරීමට නියමිත පැමිණිල්ල :

ශ්‍රී ලංකා ගුවන් හමුදාව භාවිතා කරනු ලබන F – 07 ප්‍රහාරක යානාවේ රේඩාර් පද්ධතියකට අයත් Radar receiver නමින් හඳුන්වන කොටයක් අකර්මණ්‍ය වූ බැවින් මෙම උපකරණයේ නිෂ්පාදක සමාගම වන CATIC සමාගම මෙම උපකරණ කොටස පරීක්ෂාකර බලා අලුත් වැඩියාව සඳහා වන මුදල ඇස්තමේන්තු ගත කිරීම සඳහා උපකරණ කොටස චීනය වෙත යැවීම සඳහා ගුවන් හමුදා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය වර්ෂ 2013 දෙසැම්බර් මස 03 වන දින ලබා ගෙන ඇති අතර එම ලිපිය ඇමුණුම "අ" ලෙස අමුණා ඇත.

CATIC සමාගමේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදාව Radar receiver උපකරණය චීනය වෙත යැවීම සඳහා සුදුසු Freight Forwarder කෙනෙකු තෝරා ගැනීම සඳහා 2014 පෙබරවාරි මස 05 වන දින ලංසු කැඳවන ලදි. මෙම ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබුවේ Care Logistics (Pvt) Ltd යන නමින් හඳුන්වන ලබන ආයතනයකටය. Care Logistics ආයතනයට ලබා දුන් ඇණවුම්පත (Order Form) ඇමුණුම "ආ" ලෙස අමුණා ඇත.

මෙම Radar receiver උපකරණය 2014 .04 .24 වැනි දින චීනය වෙත යැවීම සඳහා Care Logistics (Pvt) Ltd ආයතනයේ එම් ඒ එස් ප්‍රනාන්දු යන අය හට කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ඇති Sri Lankan Cargo Village යන ස්ථානයේ දී රේගු පරීක්ෂාවෙන් පසු භාරදෙන ලදී. ඉන් පසු චීනය වෙත Radar receiver උපකරණය රැගෙන යාමේ වගකීම පැවරුනේ Care Logistics (Pvt) Ltd වෙතයි. Radar receiver උපකරණය Care Logistics (Pvt) Ltd වෙත භාර දුන් හා භාර ගත් බවට අත්සන් කරන ලද ලිපියේ පිටපතක් ඇමුණුම "ඇ" ලෙස අමුණා ඇත.

වර්ෂ 2014 මැයි මස 25 වන දින CATIC ආයතනය මෙම Radar receiver උපකරණය ලැබී නොමැති බව සඳහන් කරන ලද ලිපියක් මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව දැනුවත් කර ඇත. එම ලිපිය ඇමුණුම "ඈ" ලෙස මේ සමඟ අමුණා ඇත.

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් Radar receiver උපකරණය එය යායුතු ගමනාන්තය වෙත නොයාම පිළිබඳව ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් වර්ෂ 2014 ජුනි මස 19 වන දින Care Logistics (Pvt) Ltd ආයතනය මගින් විමසන ලද අතර ඒ සඳහා ඔවුන් ගෙන් යහපත් ප්‍රතිචාරයක් නොලැබුණ අතර Radar receiver උපකරණය ක්වාලාලම්පූර් ගුවන්තොටුපලේදී අස්ථාන ගත වී ඇති බව වර්ෂ 2014 අගෝස්තු මස 04 වැනි දින දැනුම් දී ඇත. එම ලිපිය ඇමුණුම "ඉ" ලෙස අමුණා ඇත.

මෙම Radar receiver උපකරණය ඇ.ඩො. 536,000.00 පමණ වටිනාකමකින් යුක්ත වූ අතර හා මෙම උපකරණය ත්‍රස්තවාදී කණ්ඩායමකට පත් වුව හොත් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට හානි විය හැකි බව යන කරුණු දෙක මත මෙම උපකරණය සොයා දෙන ලෙස Care Logistics (Pvt) Ltd ආයතනය වෙත බල කර සිටියද ඔවුන් ඒ පිළිබඳව කිසිදු උනන්දුවක් දක්වා නැති අතර, ඒ වෙනුවට Radar receiver උපකරණය නැතිවූ බව, මෙම උපකරණය චීනයට යැවීම සඳහා භාර ගනු ලැබූ Air Asia X Cargo නැමැති ආයතනය වෙත පැමිණිලි කරන මෙන් දන්වා සිටින ලදී.

ඉන් පසු මෙම ආයතනය මගින් Radar receiver උපකරණය සෙවීම අතහැර ඇත. මෙම උපකරණයේ වටිනාකම සහ ජාතික ආරක්ෂාව කෙරෙහි වන බලපෑම සලකා බලා මේ සඳහා වගකිව යුතු Care Logistics (Pvt) Ltd ආයතනය කැඳවා මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් කරන මෙන් ඉල්ලා සිටිමි.